1978-1-31

# ජාතික රාජ්‍ය සභාවේ
# 1978 අංක 1 දරන කම්කරුවන්ගේ
# අයවැය සහන දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1978 ජනවාරි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 ජනවාරි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

මිල : ශත 40 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 1 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1978 ජනවාරි මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 62/77.

**කම්කරුවන්ට සේවායෝජකයන් විසින් අයවැය සහන දීමනාවක් ගෙවනු ලැබීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 1 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1977 දෙසැම්බර් මස පළමුවන දින එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*නියම බලධරයා.*

2. (1) මේ පනතේ කාර්යය සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

(2) මේ පනතින් නියම බලධරයා වෙත දෙනු ලැබූ යම් බලයක් හෝ නියම කරනු ලැබූ යම් කටයුත්තක් හෝ පවරනු ලැබූ යම් කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

*විශේෂ දීමනාව ගෙවීම.*

3. යම් කර්මාන්තයක සෑම සේවායෝජකයකු විසින් ම, තමා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සෑම කම්කරුවකුට ම මෙහි පහත දක්වා ඇති පදනම මත ගණන් බලනු ලැබූ ("විශේෂ දීමනාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) දීමනාවක් අදාළ දිනයෙහි සිට එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු ය :—

(අ) මාසික ප්‍රමාණයක් මත පාරිශ්‍රමිකය ගෙවනු ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය සඳහා එම කම්කරුවාට ගෙවිය යුතු වේතනයෙන් හෝ වැටුපෙන් සියයට විසි පහකට නො අඩු ප්‍රමාණයක් විය යුතු ය ;

(ආ) දෛනික වැටුප් ප්‍රමාණයක් මත වැටුප් ගෙවනු ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය තුළ එම කම්කරුවා වැඩ කර ඇති එක් එක් දිනය සඳහා ඔහුට ගෙවිය යුතු දෛනික වැටුප් ප්‍රමාණයෙන් සියයට විසි පහකට නො අඩු ප්‍රමාණයක් විය යුතු ය ;

(ඇ) කෑලි ප්‍රමාණයේ පදනමක් මත සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, ඒ කෑලි ප්‍රමාණය අනුව ඒ මාසය සඳහා ඒ කම්කරුවාට ගෙවිය යුතු වේතනයෙන් සියයට විසි පහකට නො අඩු ප්‍රමාණයක් විය යුතු ය :

එසේ වුව ද (අ) ඡේදය යටතේ හෝ (ආ) ඡේදය යටතේ හෝ (ඇ) ඡේදය යටතේ හෝ ගෙවිය යුතු විශේෂ දීමනාව කවර හෝ අවස්ථාවක රුපියල් පනහ නො ඉක්මවිය යුතු ය.

2—ඒ 81277—19,270 (78/01)

ස්වා නියුක්තිය ...පවත්වා ...ගත යාම ...ම්බන්ධයෙන් ...ශේෂ ...විධිවිධාන.

4. අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි, යම් සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සෑම කම්කරුවකු ම එම සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩවා සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ කම්කරුවා භුක්ති විඳිමින් සිටි, (මේ පනතේ 3 වන වගන්තිය යටතේ ගෙවිය යුතු විශේෂ දීමනාව හැර) කවර නාමයකින් හෝ අභිධානයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නො අඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත, ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

ලේඛනය ...පවත්වා ...ගෙන යාම ...ස්වා ...යෝජකගේ කාර්යය බව.

5. (1) යම් කර්මාන්තයක කම්කරුවකුගේ සේවායෝජකයකු විසින්—

(අ) සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති එක් එක් කම්කරුවාගේ නම;

(ආ) ඔහු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති එක් එක් කම්කරුවා විසින් ඉටු කරනු ලබන වැඩයේ වර්ගය; සහ

(ඇ) මේ පනතේ 3 වන වගන්තිය අනුව ඒ එක් එක් කම්කරුවාට ගෙවනු ලබන මුදල

දැක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද, ඒ ස්ථානයෙහි තබා ගෙන පවත්වා ගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ලේඛනයක් පවත්වා ගෙන යන්නා වූ හෝ, පවත්වා ගෙන ගිය හෝ සෑම සේවායෝජකයකු ම අදාළ දිනයෙන් ආරම්භව අවුරුදු හතරක කාලයක් එම ලේඛනය සුරක්ෂිතව තබා ගත යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා එම ලේඛනය ඉදිරිපත් කරන ලෙස හෝ එම ලේඛනයේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට, එසේ කළ යුතු ය.

නියම බලධරයාගේ බලතල.

6. නියම බලධරයාට—

(අ) යම් ලේඛනයක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා හෝ කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති යම් ස්ථානයකට, දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළු වී එම ස්ථානය පරීක්ෂා කිරීමට; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට, පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් ලේඛනයක් නො මැති නම්, ඒ ලේඛනය නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ එම බලධරයාගේ කාර්යාලයේ දී ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට; හෝ

(ඈ) එවැනි යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමට ; හෝ

(ඈ) එම ස්ථානයේ දී තමාට දක්නට ලැබෙන්නා වූ ද ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක සේවායෝජකයකු හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති කම්කරුවකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට ; හෝ

(ඉ) යම් කර්මාන්තයක කම්කරුවන්ගේ යම් සේවායෝජකයකුට—

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලුම කම්කරුවන්ට හෝ ඒ කම්කරුවන්ගෙන් සමන්විත යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද මේ පනතේ කාර්යය සඳහා තමා විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් තමා නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; හෝ

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක්

නිශ්චිත දිනයක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලියවිල්ලකින් විධාන කිරීමට

බලය ඇත්තේ ය.

7. (අ) 6 වන වගන්තිය යටතේ යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නියම බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලෙස ඔහුට වුවමනා වන්නා වූ විධි සැලසීම පැහැර හරින ; හෝ වැරදි හා දණ්ඩන.

(ආ) ඒ වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ හිරිහැර කරන ; හෝ

(ඇ) ඒ බලධරයා විසින් තමාට ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස නියම කරන යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන ; හෝ

1- ශ්‍රී 21277 (78/01)

(ඈ) යම් ලේඛනයක යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා-වූ යම් ප්‍රකාශයක් කරන හෝ කරනු ලැබීමට සලස්වන නැතහොත්, එම බලධරයා වෙත යම් ලේඛනයක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන නැතහොත් දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින ; හෝ

(ඉ) ඒ වගන්තියෙන් පවරනු ලැබූ බලතල යටතේ ක්‍රියා කරන එම බලධරයාට යම් තොරතුරක්, එය සාවද්‍ය බව දැන දැනම සපයන ; හෝ

(ඊ) 6 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ, ඒ වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට, යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් දැන දැනම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කරනු ලැබීමට හෝ සපයනු ලැබීමට සලස්වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම කම්කරුවකුගේ වේතනවල කොටසක් විය යුතු බව.

8. මේ පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු විශේෂ දීමනාව, සියලු කාර්ය සඳහා ඔහුගේ වේතනවල කොටසක් වන බව සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, සෑම සේවායෝජකයකුට ම යම් ලිඛිත නීතියකින් එවැනි කම්කරුවකුගේ වේතනය ගෙවීමට නියම කරනු ලැබුවේ යම් කාල පරිච්ඡේදයක් තුළ ද ඒ කාල පරිච්ඡේදය තුළ දී එවැනි කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් එම විශේෂ දීමනාව එම කම්කරුවාට ගෙවිය යුතු ය.

කම්කරුවන්ට ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.

9. (1) මේ පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති මුදලක් ගෙවීම පැහැර හරින හෝ 4 වන වගන්තියේ හෝ 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම සේවායෝජකයකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබූ යම් මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින්, එම වරද සඳහා ඒ අධිකර

ණය විසින් නියම කළ හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවේ සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම සේවායෝජකයාට ආඥා කරනු ලැබිය යුතු ය; තව ද ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් ඒ මුදල අධිකරණය විසින් නියම කරන ලද දඩයක් මෙන් අධිකරණයේ ආඥාව පිට අයකර ගනු ලැබ ඒ කම්කරුවාට ගෙවිනු ලැබිය යුතු ය.

10. (1) යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට, මේ පනත යටතේ ගෙවීමට නියමිත යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, සේවායෝජකයා එසේ වරදකරු කරනු ලැබූ වරද පිළිබඳව අධිකරණය වෙත පැමිණිල්ල කළ දිනයට පෙරාතුවම වූ අවුරුදු හතර ඇතුළත යම් අවස්ථාවක දී ඒ කම්කරුවාට හෝ වෙනත් කම්කරුවකුට හෝ කම්කරුවන්ට මේ පනතේ විධිවිධානවලට අනුව ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් ඒ සේවායෝජක විසින් කරන ලද යම් පැහැර හැරීමක් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට නඩු විභාගය ආරම්භ වීමට පෙර යම් අවස්ථාවක දී ඒ සේවායෝජකයා වෙත නියමිත ආකාරයෙන් වූ දැන්වීමක් කර ඇත්නම්, එසේ සාක්ෂි දීම කළ හැකි අතර, ඒ පැහැර හැරීම ඔප්පු වූ විට සේවායෝජකයාගෙන් ඒ කම්කරුවාට හෝ කම්කරුවන්ට ලැබිය යුතු යයි අධිකරණයට පෙනී යන යම් මුදලක් ගෙවන ලෙස අධිකරණය විසින් ඒ සේවායෝජකයාට නියම කළ හැකි ය. මේ උපවගන්තිය යටතේ ගෙවන ලෙස නියම කරනු ලැබූ යම් මුදලක් දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගනු ලැබිය හැකි ය. ඇතැම් අවස්ථාවල කම්කරුවන්ට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

(2) මේ වගන්තියෙහි "නියමිත" යන්නෙන් 11 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත යනුවෙන් අදහස් වේ.

11. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතියේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූව හොත් මේ පනතෙහි—

"කොමසාරිස්වරයා", "සේවායෝජකයා" හා "වේතන", ය— නෙහි පඩි පාලක සභා ආඥාපනතෙහි පිලිවෙළින් ඒ— දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කර්මාන්තය" යන්නට සේවායෝජකයකු විසින් — කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, — කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කාර්— ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපා— යක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මා— න්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත්, සේවායෝජ— යකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙ— ම ප්‍රාග්ධනය සපයනු ලැබූ යම් සංස්ථාගත හෝ සංස්— ගත කරනු නොලැබූ මණ්ඩලයක් විසින් පවත්වා ගෙ— යනු ලබන හෝ ප්‍රධාන වශයෙන් බාලාපරාධකරුවන් හෝ අනාත් දරුවනට හෝ අසරණ, ගොළු, බිහිරි — අන්ධ තැනැත්තන්ට කාර්මික පුහුණුවක් ලබා දී— කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්— යක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් ඊට ඇතුළ— නොවේ; තව ද

"කම්කරුවා" යන්නෙන් යම් කර්මාන්තයක යම් වැඩක් වාචි— වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ — ගිවිසුමක් යටතේ කිරීමට යම් සේවායෝජකයකු විසින් කවර වූ හෝ තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කර ඇ— තැනැත්තකු අදහස් වන අතර එයට යම් ලිඛිත නිති— කින් හෝ අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිම— කරනු ලැබූ කම්කරුවකු සහ කෑලි ප්‍රමාණය අනුව ගෙවීම— සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු ඇතුළත් ව— නමුත්, ගෘහසේවකයකු හෝ සේවායෝජකයකු— පෞද්ගලික රියදුරකු හෝ එයට ඇතුළත් නොවේ.

මේ පනෘ යටතේ ප්‍රත ගෙ— කම්කරු— වේතනව නොවස— විය යුතු

කම්කරු ලැබිය — මුදල් — පැහැර